# මගේ ලෝකය

*There is only one happiness in this life, to love and be loved. ..*



## ගල් වූ මිනිසකුගේ කතාව

# කැන්ගරු වන්නම

අවුරුදු විස්සක් ඔස්ට්‍රේලියාවට සිංහල පත්තර ගෙනෙන්නට වැය කළ ජීවිතයේ ආශ්වාදණීය මතක අපමණ ය. කිසිවකුට තේරුම් ගත නොහැකි තරම් කටුක ඒ මාර්ගය දෙස නැවත හැරී බැලීමේදී මගේ මතකයට එන දේ අතරින් එකක් වන්නේ මේ ගමනේදී මට හමුවූ සුන්දර මිනිසුන් පිලිබඳ මතකය යි.



සෙරෙන්ඩිබ් නිව්ස් පුවත්පතේ සිංහල පිටු වලින් ඇරඹී පහන සහ සන්නස හරහා ආ මේ ගමනේදී අමතක නොවන පිරිසක් වන්නේ මේ පත්තර පිටු ඔස්සේ ඉදිරියට ආ ලේඛක ලේඛිකාවන් පිරිසයි. ඒ අතරින් ලක්ෂ්මන් කොඩිතුවක්කු ලේඛකයා කැපී පෙනෙයි. ඒ තරමටම මම ඔහුගේ ගමන් මග නිරීක්ෂණය කරමින් සිටියෙමි.

මෙයට පෙර කීපවතාවක්ම ලියා ඇති පරිදි කෙටිකතාකරුවකු කවියකු විශේෂාංග ලේඛකයකු ලෙස ඔහු ආ ගමන මුළ සිටම මම බලා සිටියෙමි. ඒ අවස්ථාවේ මගේ සිතට එකවර ඇතුල්වූයේ ඒ කතා රැසයි. මේ කතා තුළින් අවශ්‍ය කොටස් තෝරා බේරා ගනිමින් සිය නවකතාව නිර්මාණය කරන්නට ලක්ෂ්මන් දක්වා තිබූ කුසලතාව අපූරු එකකි. ජීවත්ව සිටින්නන් අපහ-සුවට පත් නොකර සිය නිර්මාණය ගොඩ නගන්නට ඔහුට හැකිවී ඇති බව දැකීම සතුටකි.

ජිනේන්ද්‍ර, ස්වර්ණතිලක නැටුම් ගුරුතුමාගේ නර්තන කණ්-ඩායම සමග ඕසට්‍රේලියාවේ සිඩ්නි නුවර සංචාරයකට එක්වන්නේ ඕස්ට්‍රේලියාවට පැනගැනීමේ ඒකායන අරමුණෙන් ය. තමහන්ගේ සියලුම ප්‍රශ්න වලට විසඳුම ඇත්තේ ඒ තීරණය මත යයි විශ්වාස කරන ඔහු සිය ගැබ්බර බිරිඳ වන සුගන්ධිකා පවා ලංකාවේ තනිකර දමා ඕස්ට්‍රේලියාවට පැනගනියි. ඔහුගේ මේ උත්සාහය සාර්ථකවනු ඇතිද? ඔහුට මෙරටේ ස්ථිර පදිංචිය සඳහා අවශ්‍ය වීසා ලබා ගත ගමනේ කූඨප්‍රාප්තිය ඔහුගේ "කැන්ගරු වන්නම" නවකතාව යයි මම සිතමි.

කැන්ගරු වන්නම නවකතාව සඳහා ලක්-ෂ්මන් තෝරාගන්නේ මේ සමාජයේ අප අත් දකින අපූරු අනුභූතියකි. විවිධාකාර ක්‍රම ඔස්සේ මෙවන් රටවලට පැන සැඟවී සිට මොනයම් ක්‍රමයකින් හෝ සිය පැවැත්ම තහවුරුකරගන්නා අය අප අනන්තවත් දැක ඇත. තමන් මෙවන් අයකු පිළිබඳ නවකතාවක් ලියන බව කලකට පෙර ලක්ෂ්මන් මට කියූ හැකි වේද? ලක්ෂ්මන් සිය කතාව ගොඩ නගන්නේ මේ සියලු ප්‍රශ්න එකින් එක අප හමුවේ දිගහරිමින් ය. ඒ අතරේ මිනිස් සිත් තුළ උපදින විවිධාකාර මනෝභාවයන් හමුවේ මේ චරිත හැසිරෙන ආකාරය අප හමුවේ මනාව තබන්නට ඔහු සමත් වෙයි.

ලක්ෂ්මන්ගේ කැන්ගරු වන්නම නවකතාවේ අපට හමුවන චරිත සුදු සහ කලු ලෙස වෙන් කළ නොහැකි ය. ඒ චරිත මේ මිනිස් ලෝකයේ අප අත් දකින් හොඳ නරක දෙකම පොදි බැඳගත් ගැහැනුන් සහ මිනිසුන් ය. ඔවුන් නවකතාවේ හැසිරෙන්නේද ඒ කලුත් සුදුත් එක ලෙස ප්‍රදර්ශනය කරමින් ය.

කෙටිකතාකරුවකු ලෙස ලක්ෂ්මන් ගොඩනගාගත් මනා බස මේ නවකතාව තුළද අපට දකින්නට ලැබෙයි. ඒ බස ප්‍රාණවත් ය. සුගම ය. නිරවුල් ය.

තම තමන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ගැහැනුන් සහ මිනි සුන් සිය ජීවිත පරදුවට තබන අවාසනාවන්ත පරිසරයක් පිලිබඳ මේ කතාව අවසානයේ මේ ගමනින් ජිනේන්ද්‍ර සැබෑ ජයග්‍රහණයක් ලබාගත්තාද? කතාව අවසානයේ කතුවරයා අප හමුවේ ඉතිරිකර යන ප්‍රශ්නය එයයි. ඒ ප්‍රශ්නයට පිලිතුර එක් එක් පාඨකයා තම තමන් විශ්-වාස කරන පුරුෂාර්ථ අනුව තීරණය කරගනු ඇත.



ලක්ෂ්මන්

ජගත් ජේ එදිරිසිංහ

## මිණි ගං දැළ



සමන් ලෙනින් අපූරු ප්‍රතිභාවක් පෙන්වන යුගයේ තරුණ ගායකයා ය. ඔහු හා සම්බන්ධ වී "මිණි ගං දැළ" ටෙලි නාට්‍යයේ තේමා ගීතය නිර්මාණය වීම ආශ්වාදණීය මතකයකි.

එය ටෙලි නාට්‍යයක් වෙනුවෙන් මා අතින් ලියැවුණ දෙවන ගීතයයි. පළමු ගීතය ලිව්වේ කැලුම් පාලිත මහීරත්නගේ "විසුළ අහස යට" ටෙලි නාට්‍යයටය.



මිණි ගං දැළ ටෙලි නාට්‍යයේ කතා තේමාව බැඳෙන්නේ ලංකාවේ එක් යුගයක ගංගා ඔස්සේ පාරු වලින් භාණ්ඩ ප්‍රවාහණය කළ යුගයයි. මේ යුගය හා සම්බන්ධවම නෙ-ා්බට් අයගම මහතා ලියූ කාල නදිය ගලා බසී නවකතාව මගේ සිත්ගත් නවකතාවකි. මුල් ගීතය ලියැවුණේ ඒ නවකතාව පදනම් කරගනිමින් ය.

පාරුකරුවන්ගේ ජීවිතය බොහෝ වෙනස් එකකි. මතුපිටින් බලන විට පෙනෙන රසවත් බව එහි අභ්‍යන්තරයේ නැත. ජීවනෝපාය ලෙස ඒ කටුක දිවි පෙවෙත තෝරාගත් මේ මිනිසුන් තව තවත් ප්‍රපාතයට වැටෙන්නේ ඉංග්‍රීසි ආණ්ඩුවේ සංවර්ධන ක්‍රියාවලියත් සමගින් මහා මාර්ස හා දුම්රිය මාර්ස බිහිවීමයි. වනාන්තර විනාශ වී ආර්ථික භෝග වගාව ඇරඹෙයි. මහාම-ාර්ග ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනය නිසා පාරුකරුවෝ අසරණ වෙති. මේ කටුක පරිසරය අළලා ගීයක් ලිවීමේ අපේ වෑයම විය. ඒ ගීයට සමන් ලෙනින් මනා තනුවක් නිර්මාණය කළ අතර ඔහුගේ හඬ පෞර්ශයෙන් ඒ ගීය රසවත් විය.

මිණි ගං දැළ නිර්මාතෘවරුන් මේ ගීය තමන්ගේ ටෙලිනාට්‍යයේ තේමා ගීතය ලෙස තෝරා ගැනීමත් සමගම අපට එහි පදවැල් දෙකක් පමණක් වෙනස් කරන්නට සිදුවිය. ඒ අපූර් ගීය අසන්නන්ගේ සිත් බැඳ ගැනීම අපමණ සතුටකි.

මේ මතකය අලුත් වුණේ සමන් ලෙනින් මෙල්බන් නගරයේදී ඔහුගේ භූමි ප්‍රසංගය ඉදිරිපත් කිරීම නිසා ය

**මිණි ගං දැලේ**
**සඳ හැංගුණේ**
**ඔරුවේ තොටුපළේ**
**පාළුවේ.. මහා පාළුවේ..**
**හෙළුෑ සුසුමද**
**මේ හමා යන්නේ**

**සිතුවම**
වසන්ත ශ්‍රීනාත් කුරුකුලසූරිය

